**සියළුම ශ්‍රී ලාංකිකයන් වෙත කෙරෙන දැන්වීමයි**

ඔබ සියළු දෙනා දන්නා පරිදි, 2018.08.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි එක්සත් ආරබි එමීර් රජය විසින් ප්‍රකාශිත පොදු සමා කාලය ක්‍රියාත්මක කෙරෙනු ඇත. ඩුබායිහි ආගමන බලධාරීන් විසින් අප කොන්සල් ජනරාල් කාර්යාලය දැනුවත් කළ පරිදි, වීසා නිති උල්ලංඝනය කරන ලද පුද්ගලයින්ගේ එකී තත්වය නීත්‍යානුකූල බවට පත් කිරිම සදහා සහ වීසා නීති උල්ලංඝණය කරන ලද පුද්ගලයින් මෙරටින් පිටවීමට සැලැස්වීම උදෙසා එක්සත් ආරාබි එමීර් රජය මගින් පහත සඳහන් ක්‍රියා පරිපාටියන් අනුගමනය කරනු ඇත.

උපුටා ගැනීම

- **විසා නීති උල්ලංඝනය කරන ලද පුද්ගලයින්ගේ එකී තත්වය නීත්‍යානුකූල බවට පත් කිරීම**
  - අදාළවන සියළුම මූලා දඩ මුදල් වලින් නිදහස් කිරීම (නේවාසික තත්වය මත, එමිරේට්ස් හැඳුනුම්පත මත, කම්කරු කාඩ් පත මත පැනවූ මූල්‍යා දඩ මුදල්)
  - අනුග්‍රාහකයා (Sponsor) කරා නැවත යොමු කිරීමකින් තොරව පැන යාමට (Absconding) අදාළවන ලිපිගොනු අහෝසි කිරිම.
  - වීසා නීති උල්ලංඝනය කරන ලද පුද්ගලයින්ගේ එකී තත්වය නීත්‍යානුකූල බවට පත් කිරීම සඳහා ඩිරාම් 521/- ක මුදලක් අයකෙරේ.
  - වීසා තත්වය අළුත් කිරීමේදී හෝ නව අනුග්‍රාහකයෙක් යටතට පැමිණීමේදී නේවාසික පුරවැසියන්ට බලපැවැත්වෙන නීතිවලට අනුකූල විය යුතුය.

- **වීසා නීති උල්ලංඝනය කරන ලද පුද්ගලයින් මෙරටින් පිටවීමට සැලැස්වීම**
  - සියළුම මූල්‍යා දඩමුදල් වලින් නිදහස් කෙරෙන අතර කවර හෝ පැනයාමේ (Absconding) ලිපිගොනුවක් ක්‍රියාත්මක නම් එය අහෝසි කෙරේ.
  - තනි පුද්ගලයකු වශයෙන් පැනයාමේ ලිපිගොනුව අහෝසි කිරීම සඳහා අයදුම් කරන්නේ නම් ඩිරාම් 121/- ක මුදලක් අයකෙරෙන අතර, එය පෞද්ගලික ආයතනයන්හි සේවය කරන ලද පුද්ගලයින් වෙනුවෙන් ඩිරාම් 521/- ක් සහ රාජ්‍ය ආයතනයන්හි සේවය කරනු ලැබූ පුද්ගලයෙක් නම් ඩිරාම් 71/- ක් වශයෙන් අයකෙරේ.
  - පිටවයාමේ බලපත්‍රය සඳහා වන ගාස්තුව ඩිරාම් 221/- කි.
  - පිටවයාම සඳහා වලංගු ගමන් බලපත්‍රයක් අනිවාර්යෙන්ම සතුවිය යුතුය.
  - එකී ගමන් බලපත්‍රයක් නොමැති නම් ඒ වෙනුවට කොන්සල් ජනරාල් කාර්යාලය මගින් නිකුත් කරන ලද වලංගු ගමන් බලපත්‍රයක් අදාළ පුද්ගලයා විසින් තබා ගත යුතුය.
  - වීසා නීති උල්ලංඝනය කරන ලද තැනැත්තන් විසින් අදාළ ආගමන බලධරයා වෙත පැමිණ (අවීර් ආගමන විගමන කාර්යාලය) අදාළ දිනයට දින 10 කට පසු දිනක් සඳහා වෙන් කරන ලද ගුවන් ටිකට් පතක් ඉදිරිපත් කල යුතුය.
  - වීසා නීති උල්ලංඝනය කරන ලද තැනැත්තන්හට කිසිදු තහනමකින් තොරව මෙරටින් පිටව යා හැකිය.

උපුටා ගැනීම අවසන්

ඊට අමතරව ඉහත කී කාර්ය පටිපාටියන්හි වැඩි විස්තර සඳහන් කරමින් ඩුබායිහි ආගමන බලධරයන් විසින් නිකුත් කරන ලද අත්පොතෙහි පහත සඳහන් මාර්ගෝපදේශද දක්වා ඇත.

උපුටා ගැනීම

- මානව සම්පත් සහ එමිරාටිකරණය පිළිබඳව වන අමාත්‍යාංශය විසින් අදාළ අයදුම්කරුවන් සඳහා මාස 06 ක තාවකාලික නේවාසික වීසා කාලයක් ලබාදෙනු ඇත.
- මෙයින් ලබන ප්‍රතිලාභ, ඩුබායි හි වීසා සහ ඇතුළත් වීමේ බලපත්‍ර (Entry permit ) මත සිටිමින් වීසා නීති උල්ලංඝනය කරන ලද තැනැත්තන් සඳහා පමණක් සීමාවේ.
- කිසියම් වීසා නීති උල්ලංඝනය කරන ලද තැනැත්තෙකු මෙරටතුළදී තම වීසා තත්වය නීත්‍යානුකූල භාවයට පත් කර ගැනීම සඳහා අපේක්ෂා කරන්නේ නම් එකී පුද්ගලයාගේ වීසා වෙනත් එමීරයක් මගින් නිකුත් කර ඇත්නම් මෙන්ම ඔහු හෝ ඇය සඳහා පැනයාමට අදාළ (Absconding) වන ලිපිගොනුවක් විවෘතව ඇත්නම්, එකී තැනැත්තා විසින් අදාළ ලිපිගොනුව අහෝසි කර ගැනීම සඳහා අදාළ එමීරයන්හි බලධරයින් වෙත යොමුවිය යුතුය.

උපුටා ගැනීම අවසන්

ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින්, පහත දැක්වෙන ආකාරයට මෙකී පොදුසමා යෝජනාව යටතේ ප්‍රතිලාභ ලැබීමට අපේක්ෂිත පහත සඳහන් වර්ග දෙකට අයත් ශ්‍රී ලාංකිකයින්හට පහත දක්වා ඇති පරිදි පහසුකම් සලසා දෙනු ඇත.

**(අ). පොදුසමා යෝජනාව යටතේ මෙරටින් පිටවීමට අපේක්ෂිත ශ්‍රී ලාංකිකයන්**

1. පොදුසමාව යෝජනාව යටතේ මෙරටින් පිටවීමට අපේක්ෂිත, නීත්‍යානුකූල භාවයෙන් තොරව මෙරට රැඳීසිටි ශ්‍රී ලාංකිකයන් පහත ආකාර 03 ට වර්ගීකරණය කල හැකිය.

I. වලංගු ගමන් බලපත්‍රයක් හිමි ශ්‍රී ලාංකිකයන්
II. කල් ඉකුත්වූ ගමන් බලපත්‍රයක් හිමි ශ්‍රී ලාංකිකයන්
III. සිය ගමන් බලපත්‍රය අස්ථානගතවූ හෝ සොරකම් කරන ලද ශ්‍රී ලාංකිකයන්

02. ඩුබායි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය සහ ඩුබායිහි ආගමන විගමන බලධරයන් සමග සම්බන්ධීකරණයෙන් යුක්තව පහත දක්වා ඇති පරිදි මෙරටින් පිටවීම සඳහා ඉහත වර්ගීකරණය කරන ලද ශ්‍රී ලාංකිකයන්ට අවස්ථාව සැලසේ.

I. නීත්‍යානුකූල භාවයෙන් තොරව මෙරට කාලයක් රැඳීසිටි වලංගු ගමන් බලපත්‍ර සහිත ශ්‍රී ලාංකිකයන්හට අදාළ එමීරයන්හි බලධාරීන් වෙත යොමුවී (තම වීසා නිකුත් කරන ලද එමීරය) තමාගේ දඩ මුදල්වලින් නිදහස්ව ආගමන විගමන බලධරයින් විසින් අයකරන නාමික ගාස්තුව ගෙවා මෙරටින් පිටවිය හැකිය.

II. කල් ඉකුත්වූ ගමන් බලපත්‍රයක් සහිත ශ්‍රී ලාංකිකයන් හට එකී බලපත්‍රය අතැතිව ඩුබායි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය වෙත පැමිණ නව වලංගු ගමන් බලපත්‍රයක් සඳහා අයදුම්කල හැකිය, අනතුරුව එකී ශ්‍රී ලාංකිකයන්හට අදාළ එමීරයන්හි බලධාරීන් වෙත යොමුවී (තම වීසා නිකුත් කරන ලද එමීරය) තමාගේ දඩ මුදල්වලින් නිදහස්ව ආගමන විගමන බලධරයින් විසින් අයකරන නාමික ගාස්තුව ගෙවා මෙරටින් පිටවිය හැකිය.

III. තම ගමන් බලපත්‍රය අස්ථානගතවූ හෝ සොරකම්කරන ලද ශ්‍රී ලාංකිකයන් හට අදාළ එමීරයේ පොලිසිය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කොට ඒ පිළිබඳව අදාළ පොලිසිය මගින් නිකුත් කරන ලද සහතිකය තම වලංගු ගමන් බලපත්‍රය ලබා ගැනීම සඳහා ඩුබායි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කල හැකිය. අනතුරුව එකී ශ්‍රී ලාංකිකයන්හට අදාළ එමීරයන්හි බලධාරීන් වෙත යොමුවී (තම වීසා නිකුත් කරන ලද එමීරය) තමාගේ දඩ මුදල්වලින් නිදහස්ව ආගමන විගමන බලධරයින් විසින් අයකරන නාමික ගාස්තුව ගෙවා මෙරටින් පිටවිය හැකිය.

**(ආ). තම වීසා තත්වය නීත්‍යානුකූල භාවයට පත්කර ගනිමින් මෙරට විසීමට බලාපොරොත්තුවන ශ්‍රී ලාංකිකයන්**

I. ඩුබායි ආගමන විගමන කාර්යාලය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ වලින් ප්‍රකාශිත පරිදි අදාළ ගාස්තු ගෙවා, ඩුබායි ආගමන විගමන බලධරයින් විසින් පනවන ලද නීති සහ රෙගුලාසිවලට යටත්ව, අමර් මධ්‍යස්ථාන (Amer Centers) ඔස්සේ වීසා තත්වය නීත්‍යානුකූල කරගත යුතුවේ.

II. මෙම පසුබිම යටතේ, මාස 06 ක කාලයකට වඩා වැඩියෙන් තම ගමන් බලපත්‍රයන්හි වලංගු කාලයක් සහිත (වීසා මුද්‍රණය කිරිම සඳහා සාමාන්‍යයෙන් අවශ්‍යවන අවම කාලය) ශ්‍රී ලාංකිකයන්හට තම නේවාසික භාවය නීත්‍යානුකූල කරගැනීම සඳහා සෘජුවම අමර් මධ්‍යස්ථාන (Amer Centers) වෙත යොමුවිය හැකිය.

III. වලංගු ගමන් බලපත්‍රයක් නොමැති එහෙත් නව ගමන් බලපත්‍රයක් සඳහා අයදුම් කිරිමට අපේක්ෂා කරන ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් කොළඹ පිහිටි ආගමන විගමන දෙපාර්තමේන්තුව විමසමින්, තම සීමාවන්ට යටත්ව මෙන්ම ශ්‍රී ලංකා ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ සුවිශේෂී අභිමතය ආගමන විගමන පාලක ජනරාල්වරයාගේ විෂය පථය යටතට ගැනෙන බවටද අවබෝධයෙන් යුක්තව, අවම කාල පරාසයක් තුලදී වලංගු ගමන් බලපත්‍රයක් නිකුත් කිරිම සඳහා විධි මෙම කොන්සල් ජනරාල් කාර්යාලය විසින් සොයා බැලෙමින් පවතී. ඒ අනුව ගමන් බලපත්‍රයක් අයදුම් කිරීම සඳහා අදාළවන සියළුම ලේඛනගත සාක්ෂි අයදුම්කරුවා විසින් ඉදිරිපත් කළයුතු බවට සිහිතබා ගත යුතුය. (මේ පිළිබඳ වැඩිදුර තොරතුරු ලබා ගැනීම සඳහා www.slcgdxb.com වන අපගේ වෙබ් අඩවිය වෙත පිවිසෙන්න).

මීට අමතරව යෝජිත පොදුසමා කාලය යටතේ ප්‍රතිලාභ ලැබීමට අපේක්ෂිත ශ්‍රී ලාංකික පුරවැසියන් වෙත කොන්සල් ජනරාල් කාර්යාලය මගින් පහත සඳහන් පහසුකම් සපයනු ඇත.

I. යෝජිත පොදුසමා කාලය යටතේ ප්‍රතිලාභ ලැබීමට අපේක්ෂිත ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙමින් විශේෂ කවුළුවක් ක්‍රියාත්මකව ඇත. (පුද්ගලයන් සංඛ්‍යාව මත පදනම්වේ)

II. මෙම විශේෂිත කාල පරිච්ඡේදය තුල, තනි පුද්ගලයින්ගේ ආර්ථික මට්ටම සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකාවට යාම සඳහා වන තාවකාලික ගමන් බලපත්‍ර පමණක් නොමිලයේ නිකුත් කිරීම සලකා බැලෙනු ඇත.

III. යෝජිත පොදුසමා කාලය පිළිබඳව වන විමසීම් සඳහා සුවිශේෂීව පිළිතුරු සැපයීම සඳහා විශේෂිත දුරකථන අංකයක් එනම් (04 3986991 සහ 04 3986535 දිගුව 13) සහ ඊමේල් ලිපිනයක් (assistdubaiamnesty@gmail.com) ඩුබායි කොන්සල් ජනරාල් කාර්යාලය යටතේ ස්ථාපනය කරනු ඇත.

IV. පුද්ගලයින් සංඛ්‍යාව මත පදනම්ව, දිගු කාලීනව, ශ්‍රී ලාංකිකයන් හට සහාය ලබාදීමේ අරමුණින් යුක්තව මෙරට ප්‍රධාන ආගමන විගමන කාර්යාලයන්හි ශ්‍රී ලාංකික ස්වේච්ඡා සේවකයින් ස්ථානගත කරනු ඇත.

**පොදු සමා කාලය තුළ ශ්‍රී ලංකා ගමන් බලපත්‍ර අයදුම් කිරීමේදී සිහි තබාගත යුතු වෙනත් කරුණු**

- ඔබ ශ්‍රී ලාංකික ගමන් බලපත්‍රයක් සඳහා අයදුම් කරන්නේ නම්, ඩුබායි ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයේ වෙබ් අඩවියේ දක්වා ඇති පරිදි ඒ සඳහා අදාළ වන සියළුම ලිපිලේඛන වල මුල් පිටපත් ඉදිරිපත් කල යුතුය. මේ පිළිබඳව වැඩිදුර තොරතුරු ලබා ගැනීම සඳහා http://slcgdxb.com/consular-services/passport-services/new-sri-lankan-passport/ යොමුවට පිවිසෙන්න. ශ්‍රී ලංකා ගමන් බලපත්‍රයක් නිකුත් කිරිම සඳහා අදාළ වන ලේඛන, ශ්‍රී ලංකා පුරවැසියන් සඳහා එකී ගමන් බලපත්‍ර නිකුත් කිරිම සඳහා අවසාන අභිමතය හිමි ආගමන විගමන පාලක ජනරාල් වරයා විසින් නියම කරන ලද ලේඛනවේ. එකී ලේඛනවල මුල් පිටපත් නිසියාකාරයෙන් ඉදිරිපත් කිරීම මගින් කොන්සල් ජනරාල් කාර්යාලයේ නිලධාරීන්ගේ කාර්යය පහසු කිරීමටත් ඔබගේ ගමන් බලපත්‍රය ප්‍රමාදයකින් තොරව කලට වේලාවට ලැබීමටත් හේතුවේ.

- පුද්ගලයාගේ හඳුනා ගැනීම පහසු කරනුවස් ශ්‍රී ලංකාව සහ/ හෝ එක්සත් අරාබි එමීර් රජය විසින් නිකුත් කරන ලද කවරාකාරවල හෝ හැඳුනුම්පත් ලේඛන (ශ්‍රී ලංකා ජාතික හැඳුනුම්පත, ශ්‍රී ලංකා රියදුරු බලපත්‍රය, එමිරේට්ස් හැඳුනුම්පත, එක්සත් අරාබි එමීර් රජය මගින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රය, ශ්‍රී ලංකාව සහ/ හෝ එක්සත් අරාබි එමීර් රජය විසින් නිකුත් කරන ලද උප්පැන්න සහතික) රැගෙන ඒමට සිහි තබාගන්න.

- ගමන් බලපත්‍ර නිකුත් කිරීම සඳහා ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය මගින් මුදලින් පමණක් ගාස්තු අයකෙරේ.

- ආගමන විගමන පාලක ජනරාල් වරයා විසින් නියම කරන ලද ලිපිලේඛන වල මුල් පිටපත් ඔබ සතු නොවේනම්, සේවා ලබා ගැනීමට කොන්සල් ජනරාල් කාර්යාලයට පැමිණීමට ප්‍රථමයෙන් ඒවා ශ්‍රී ලංකාවෙන් හෝ එක්සත් ආරාබි එමීර් රාජ්‍යයෙන් රැගෙන ඒමට සිහිතබා ගන්න.

- පොදුසමා කාලය තුල ශ්‍රී ලංකා පුරවැසියන්ට අදාළවන සුවිශේෂී මානුෂීය කර්තව්‍යයන් සඳහා තම සේවාවන් ඉටු කිරීමට මෙන්ම ඒවාට ප්‍රමුඛතාවය ලබාදීමටද තම සීමිත කාර්ය මණ්ඩලයට සහාය ලබාදෙනු

ඇතැයි ඩුබායි හා උතුරු එමීරේටයන්හි පදිංචි ශ්‍රී ලාංකිකයන්ගෙන් කොන්සල් ජනරාල් කාර්යාලය ධනාත්මකව අපේක්ෂා කරයි. ආගමන විගමන පාලක ජනරාල්වරයා විසින් සම්පාදිත නීති සහ රෙගුලාසි පිළිබඳව කොන්සල් ජනරාල් කාර්යාලීය කවුළුවලදී සාකච්ඡා සම්මුති පැවැත්වීමට උත්සාහ දැරීම අනවශ්‍ය මතභේදයන්ට තුඩුදෙන අතර, එය කොන්සල් ජනරාල් කාර්යාලීය කාර්ය මණ්ඩලය වෙතින් සහන බලාපොරොත්තුවන අනෙකුත් ශ්‍රී ලාංකිකයන්හට සේවා සැපයීම සඳහා ඇති වටිනා කාලය අපතේ යැවීමකි. එබැවින්, රජයේ ආයතනයක් වශයෙන් ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීතිවලට යටත්ව ස්වකීය කටයුතු කලයුතු බව මෙන්ම තම විෂය පථය යටතට ගැනෙන ඩුබායි සහ උතුරු එමීරයන්හි ශ්‍රී ලාංකිකයන්ට සහාය වීමේදී ඊට අදාළ සීමා පවතින බවත් සිහිතබා ගත යුතුය.

- ඩුබායි කොන්සල් ජනරාල් කාර්යාලය යෝජිත පොදුසමා කාලය යටතේ ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් තම උපරිම සහාය ප්‍රකාශ කර සිටින අතරම, වගකීම් සහගත, නීතිගරුක මෙන්ම විනීත පුරවැසියන් වශයෙන් මෙරටතුළ නීති විරෝධීව සිටින සියළුම ශ්‍රී ලාංකිකයන්හට උදාවී ඇති මෙම අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජනය ලබාගන්නා මෙන් අවධාරණය කර සිටිනු ලැබේ.